<u>ආදර්ශ ප්‍රශ්ණ පත්‍රය 02</u>

ප්‍රශ්ණ සියල්ලටම පිලිතුරු සපයන්න.

ඒක් නිවැරදි පිලිතුරකට ඒක් ලකුණ බැගින් ලකුණු 30 ක් හිමි වේ. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. වැටුප් වර්ධකය විලම්බනය කළ හැකි නොවන්නේ,
  i. කා.ක. ඉම් විභාගය නියමිත දිනට සමත් නොවීම
  ii. පාලනය කරගත හැකි හේතුමත ලරිවාස කාලය දීර්ග කර ඇති විට
  iii. නිලධාරියාගේ සේවය අපේක්ෂිත තත්ත්වයට වඩා පහල වැටී ඇති විට
  iv. <u>විනයානුකූල පරීක්ෂණයක් ආරම්භ කර ඇති විට</u>

02. කාර්යක්ෂමතා කඩඉම් පාලනය වන්නේ,
  i. පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි මතය
  ii. දෙපාර්ථමේන්තු ප්‍රධානියාගේ පරිපාලනාත්මක නිර්දේශ මතය
  iii. <u>බඳවා ගැනීම පරිපාටියේ හෝ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි මතය</u>
  iv. නිලධාරියාගේ සේවයේ කාර්යක්ෂමතාවය මතය

03. අංක 20/2001 හා 2001 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව,
  i. අවශ්‍ය තනතුරු සම්බන්ධයෙන් පමණක් කා.ක.ඉ. පරීක්ෂණ පැවැත්විය යුතුය
  ii. වයස අවු: 45 සම්පූර්ණ වීම මත කා.ක.ඉ. විභාගවලින් නිදහස් නොකල යුතුය
  iii. <u>2001 නොවැම්බර් 01 දින සිට චක්‍රලේඛණ ක්‍රියාත්මක විය යුතුය</u>
  iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 7 වන වැටුප් පියවරට ප්‍රථම සමත් විය යුතුය

04. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණක අධිකාරී වරයෙකු පත් කිරීමේ බලය,
  i. ජනාධිපති වරයාට හිමි වේ
  ii. ජනාධිපති ලේකම් වරයාට හිමි වේ
  iii. <u>රාජ්‍ය සේවා කොමිසන් සභාවට හිමිවේ</u>
  iv. විගණකාධිපති වරයාට හිමි වේ

05. රාජ්‍ය සේවා කොමිසන් සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව,
  i. පහකි
  ii. හතකි

iii. <u>නවයකි</u>
iv. තුනකි

06. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සේ සලකනු නොලබන්නේ ,

i. පොලිස් දෙපාර්ථමේන්තුව
ii. අධ්‍යාපන දෙපාර්ථමේන්තුව
iii. <u>විගණකාධිපති දෙපාර්ථමේන්තුව</u>
iv. මැතිවරණ දෙපාර්ථමේන්තුව

07. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීම සිදු කරනු ලබන්නේ,

i. <u>ප්‍රාථමික හා ද්වීතික මට්ටම 6% හා තෘතීක හා ජේ්‍යෂ්ඨ මට්ටම 7%</u>
ii. ප්‍රාථමික හා ද්වීතික මට්ටම 7% හා තෘතීක හා ජේ්‍යෂ්ඨ මට්ටම 6%
iii. ප්‍රාථමික හා තෘතීක මට්ටම 6% හා ද්වීතික හා ජේ්‍යෂ්ඨ මට්ටම 7%
iv. ජ්‍යෙෂ්ඨ මට්ටම හා ද්වීතික මට්ටම 6% ප්‍රාථමික හා තෘතීක මට්ටම 7%

08. ගමනක යෙදුන රජයේ සේවකයෙකු වෙනුවෙන් සංයුක්ත දීමනා ගෙවීමේදී ඔහු ලැබූ මාසික වැටුප රු:15,760 ක් වන්නේ නම් ඔහුට ගෙවිය යුතු සංයුක්ත දීමනාව වන්නේ :-

i. රු: 350
ii. <u>රු: 400</u>
iii. රු: 300
iv. රු: 500

09. සංයුක්ත දීමනා ගෙවීමේදී රු : 300 ක දෛනික වැටුපක් ලබන ධනපාලගේ 2007 වසරේ වාර්ෂික වැටුප ලෙස සැලකිය යුත්තේ,

i. රු: 72,000
ii. රු: 19,500
iii. <u>රු: 90,000</u>
iv. රු: 60,000

10. මු.රේ. 71 අදාල නොවන්නේ,

i. <u>තාවකාලික සේවකයින් ස්ථිර කිරීම</u>
ii. නව තනතුරක් ඇතැති කිරීම
iii. තනතුර නාමය වෙනස් කිරීම
iv. තනතුරක් අහෝසි කිරීමට

11. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව,

i. 22 කි
ii. 20 කි
iii. 24 කි
iv. <u>25 කි</u>

12. පලාත් සභාවක ආයතන අධ්‍යක්ෂ වරයාගේ තනතුරට අදාල වැඩ සිදු කරනු ලබන්නේ,
    i. පලාත් රාජ්‍ය සේවා කොමිසන් සභාවේ ලේකම් වරයාය
    ii. ප්‍රධාන ලේකම් වරයාය
    iii. ආණ්ඩුකාර වරයාය
    iv. ප්‍රධාන අමාත්‍ය වරයාය

13. පහත දඩුවම් අතරින් සුළු දඩුවමක් නොවන්නේ,
    i. තදින් තරවටු කිරීම
    ii. සේවා කාලය දීර්ග නොකිරීම
    iii. සතියක වැටුප අඩු කිරීම
    iv. වසරකින් වැටුප් වර්ධක අත් හිටුවීම

14. රාජ්‍ය නිලධාරීන්ට ලබා නොගන්නා නිවාඩු වෙනුවෙන් දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිවැරදි නොවන්නේ,
    i. දිරි දීමනාව ලබා ගැනීමට වසර තුල ඕනෑම මාසයක නිවාඩු අඛණ්ඩව දින හතක් ලබාගත හැක.
    ii. මෙම නිවාඩු දින සම්බන්ධයෙන් රජයේ නිවාඩු දින ගණන් ගනු නොලැබේ
    iii. රජයේ සියළුම සේවකයින් මෙම දිරි දීමනා ක්‍රමයට හිමිකම් ඇත
    iv. ඉතිරි කරගත් නිවාඩු දින සඳහා උපරිමය දින 30 ක් දක්වා දිරි දීමනා ගෙවිය හැක

15. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාව ඇතිකර ඇත්තේ සාමාන්‍ය ලිපිකරු හා සමාන්තර සේවා ,
    i. 05 ක් එකතු කිරීමෙනි
    ii. 04ක් එකතු කිරීමෙනි
    iii. 06 ක් එකතු කිරීමෙනි
    iv. 07 ක් එකතු කිරීමෙනි

16. කළමනාකරණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය බලාත්මක වන්නේ,
    i. 2003 දෙසැම්බර් 31 දින සිටය
    ii. 2003 දෙසැම්බර් 01 දින සිටය
    iii. 2004 ජනවාරි 01 දින සිටය
    iv. 2004 ජුනි 01 දින සිටය

17. දෙපාර්ථ මේන්තු ප්‍රධානීන් හා සමාන නිලධාරීන්ට ඩීසල් වාහනයක් සඳහා අනුමත ඉන්දන ලීටර් ප්‍රමාණය,
    i. ලීටර් 190
    ii. ලීටර් 145
    iii. ලීටර් 135
    iv. ලීටර් 120

18. රාජ්‍ය සේවකයෙකුගේ උත්සව අත්තිකාරම් සම්බන්ධයෙන් අය කරනු ලබන පොලී ප්‍රතිශතය ,
    i. 4%
    ii. 4.2%

iii. <u>4.5%</u>
iv. මින් එකක්වත් නොවේ

19. රාජ්‍ය නිලධාරියෙකු උසස් කිරීමේදී වැටුප් පරිවර්ථනය කිරීම සම්බන්ධයෙන් අදාල නොවන්නේ,
i. අවසාන වශයෙන් ලැබූ වැටුප් පරිමාණය සලකා බැලීම
ii. නව වැටුප් පරිමානය සලකා බැලීම
iii. <u>උපයා ගන්නා ලද වැටුප් වර්ධකයේ අගය වන වැටුප් පියවර තීරණය කිරීමේදී සලකා බැලීම</u>
iv. නව වැටුප් පරිමානයේ ආරම්භක පියවර අවසානය වශයෙන් බලා සිටි වැටුපට වඩා අඩු නම් ආරම්භක වැටුපේ තැබීම

20. රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වෙලාවන් නිවාඩු සම්බන්ධයෙන් නිවැරදි නොවන්නේ,
i. නිලධාරියෙකුගේ සේවා කාලය පෙ.ව.8.30 සිට ප.ව.4.15 දක්වාය
ii. සුළු සේවකයින්ගේ සේවා කාලය පෙ.ව.8.සිට ප.ව.4.45 දක්වාය
iii. <u>රාජ්‍ය නිළධාරිණියකට ගර්භණී අවස්ථාව මාස පහක් වූ විට පැයක් ප්‍රමාද වී පැමිණීමට පැය භාගයකට ප්‍රථම පිටව යාමට ඉඩ දිය හැක</u>
iv. පෙ.ව.8.30 ත් පෙ.ව. 9.00 ත් අතර ප්‍රමාද වී කාර්යාලයට පැමිණෙන නිලධාරියෙකුට ප.ව.4.15 න් පසුව එය වැඩ කර අවසානය කිරීමට ඉඩ දෙනු ලැබේ.

21. විශ්‍රාම ගිය රජයේ සේවකයෙකුට දිය හැකි වරප්‍රසාදයකි,
i. නිල නිවාස වල පදිංචිය
ii. ආරෝග්‍ය ශාලාවල නේවාසික පහසු කම්
iii. <u>දුම්රිය බල පත්‍රය</u>
iv. සහන පොලී මත ණය ලබාගැනීම

22. දේශපාලන අයිති වාසිකම් භුක්තිවිදිය නොහැක්කේ,
i. විදුහල්පති වරයෙකුට
ii. සමෘද්ධී නිලධාරියෙකුට
iii. <u>මාණ්ඩලික නිලධාරියෙකුට</u>
iv. සමුපකාර පරීක්ෂක වරයෙකුට

23. අමාත්‍ය මණ්ඩලය විසින්,
i. මාණ්ඩලික නිලධාරීන්ගේ පත්වීම් හා විනය කටයුතු
ii. <u>දිස්ත්‍රික් ලේකම් වරුන්ගේ පත් වීම් හා විනය බලතල</u>
iii. ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික නිලධාරින්ගේ විනය බලතල
iv. සංස්ථා සභාපති වරුන්ගේ පත්වීම් හා විනය බලතල

24. පෞද්ගලික ලිපිගොනුවක ඇතුලත් කරනු නොලබන්නේ,
i. පරිවාස කාලය දීර්ඝ කිරීමේ ලිපි
ii. ස්ථාන මාරු නියෝග
iii. අභියාචනා තීරණ
iv. <u>විනය පරීක්ෂණ වාර්ථා</u>

25. රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාදයක් නොවන්නේ,

i. ණය අත්තිකාරම
ii. විදේශ අධ්‍යාපන නිවාඩු
iii. <u>ගමන් වියදම</u>
iv. අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර

26. දෙපාර්ථ මේන්තු මාරුවීම් මණ්ඩල විෂය පථයට අයත් කරුණක් වන්නේ,

i. සේවයේ අවශ්‍ය තාවය මත කරනු ලබන මාරුවීම්
ii. විනය හේතු මත කරන මාරු වීම්
iii. <u>මාරුකළ හැකි නිළධාරීන් 25 දෙනෙකුට වැඩියෙන් සඳිටින දෙපාර්ථමේන්තුවක නිලධාරීන්ගේ මාරු වීම</u>
iv. සේවා ස්ථානය වෙනස් නොවන මාරු වීම

27. බඳවා ගැනීමේ පරිපාටියක් යනු :-

i. තනතුරක් සම්බන්දෙයන් ආයතනයක් විසින් පිළියෙල කරනු ලබන රීතී මාලාවකි
ii. සේවා ව්‍යවස්ථා සංග්‍රහෙයන් නියම කර ඇති විධිවිධානයකි
iii. <u>සේවා ව්‍යවස්ථා සංග්‍රහට අනුකූලව පිළියෙල කරනු ලබන ක්‍රියා පටිපාටියකි</u>
iv. රජයේ සේවයට බඳවා ගැනිම හෝ උසස් කිරීම කරනු ලබන ආකාරය දැක්වෙන රීත පද්දතියකි

28. රාජ්‍ය සේවයේ සියළු තනතුරු :-

i. ස්ථිරය විශ්‍රාම වැටුප් රහිතය
ii. <u>ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය</u>
iii. සමහර තනතුරු ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය
iv. මින් එකක්වත් නොවේ

29. රාජ්‍ය සේවයේ සියළු අනියම් ආදේශක හා දෛනික වැටුප් ලබන අයගෙන් සේවක අර්ථ සාධක අරමුලට දායක මුදල් ලෙස,

i. සේව්‍ය සේවක දායකය 7% ක් හා 8% කි
ii. සේව්‍ය සේවක දායකය 8% ක් හා 7% කි
iii. සේව්‍ය සේවක දායකය 8% ක් හා 12% කි
iv. <u>සේව්‍ය සේවක දායකය 12% ක් හා 8% කි</u>

30. ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමෙහිලා සලකනු නොලබන්නේ,

i. පත්කල හෝ උසස් කළ දිනයයි
ii. බඳවාගැනීමේ විභාගයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයයි
iii. <u>ඔහු විසින් වාර්ෂිකව ලබාගනු ලබන වැටුප හා ඔහුගේ සේවා කාලයයි</u>
iv. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට අසමර්ථ වීමයි